# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2053/16 – 2018 ජනවාරි මස 09 වැනි අඟහරුවාදා – 2018.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

**ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන**

මුදල් නීති පනත

(422 වැනි අධිකාරය වූ) මුදල් නීති පනතේ 32ඉ වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් පනවනු ලබන ලද රෙගුලාසි.

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි.
සභාපති,
මුදල් මණ්ඩලය.

2018 ජනවාරි මස 5 වැනි දින,
කොළඹ දී ය.

**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි**

**2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි සංශෝධනය**

| | | | |
|---|---|---|---|
| 1. | හැඳින්වීම | 1.1 | මෙම රෙගුලාසි, 2018 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි යනුවෙන් හැඳින්විය යුතුය. |
| 2. | මූලික රෙගුලාසි සංශෝධනය | 2.1 | 2010 සැප්තැම්බර් මස 28 දිනැති අංක 1673/11 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි පහත පරිදි සංශෝධනය වේ :– |

| | | |
|---|---|---|
| රෙගුලාසි 5.1 ට ආදේශනය | 2.2 | 5 වැනි රෙගුලාසිය, එහි 5.1 ඡේදය ඉවත් කිරීමෙන් පසු සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් සංශෝධනය කෙරේ : |

''5.1 රක්ෂණය කෙරෙන සුදුසුකම් ඇති තැන්පතු යටතට, සාමාජික ආයතනවල ඉල්ලුම්, කාලීන සහ ඉතුරුම් තැන්පතු වගකීම් සහ 2012.01.01 ට පෙර ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලසුම් යටතේ මුලින් තැන්පතුකරුවන් වී පසුව 2010 සහ 2011 යන වසරවල දෙනු ලැබූ මුදල් මණ්ඩල නියෝග පදනම් කරගෙන තැන්පතු කොටස් බවට පරිවර්තනය කරනු ලැබූ කොටස්කරුවන්ට එම කොටස්වල වටිනාකම ද ඇතුළත් කළ යුතු අතර, කිසිදු ණය උපකරණයක් ඇතුළත් නොකළ යුතු ය.''

මෙම කාරණය සඳහා ''තැන්පතු කොටස් බවට පරිවර්තනය කරනු ලැබූ කොටස්කරුවන්ගේ කොටස්වල වටිනාකම'' ලෙස කොටස් බවට පරිවර්තනය කරන ලද එම මූලික තැන්පතුව හෝ තැන්පතුවල වටිනාකම ගත යුතු ය.

| | | |
|---|---|---|
| රෙගුලාසි 9.6 ට ආදේශනය | 2.3 | 9 වැනි රෙගුලාසිය, එහි 9.6 ඡේදය ඉවත් කිරීමෙන් පසු සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් සංශෝධනය කෙරේ : |

''9.6 ඉහත දක්වන ලද ගණනය කිරීම්වලට අනුව, එක් තැන්පතුකරුවෙකු හට ගෙවිය යුතු වන මුළු රක්ෂිත මුදල් ප්‍රමාණය රුපියල් 600,000ක උපරිමයකට හා විදේශ විනිමය තැන්පතු සම්බන්ධයෙන් වන විට, ඉහත කී උපරිම රක්ෂිත මුදල වන රුපියල් 600,000ක වටිනාකම නොඉක්මවන මුදලකට යටත් වේ.''

| | | |
|---|---|---|
| රෙගුලාසි 10.1 ට ආදේශනය | 2.4 | 10 වැනි රෙගුලාසිය, එහි 10.1 ඡේදය ඉවත් කිරීමෙන් පසු සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් සංශෝධනය කෙරේ : |

''10.1 මුදල් මණ්ඩලය විසින් කලින් කල අනුමත කරනු ලබන විධානයන් / නියෝගයන් සහ ප්‍රතිපත්ති අනුව නිරාකරණ සහ බලගැන්වීම් අධ්‍යක්ෂගේ උපදේශකත්වය සහ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන්නා වූද, මෙහෙයුම් සහ කළමනාකරණ කටයුතු ඉටුකරන්නා වූ ද, තැන්පතු රක්ෂණ ඒකකයක් (මෙහි මින් මතු ''ඒකකය'' වශයෙන් හඳුන්වනු ලබන) නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවනු ලැබිය යුතු ය.''

3. බලාත්මක වන දිනය 3.1 ඉහත සඳහන් සංශෝධනයන් 2018 ජනවාරි මස 01 දින සිට බලාත්මක විය යුතු ය.

01 - 632

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.